# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1374 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023திகதி | දිනය<br>Date | 02/11/2023<br>පැය 1340 |

## මාධ්‍ය නිවේදනය

**මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු, හිමිනමක්, තවත් සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - ඕපාත පොලිස් ස්ථානය.**

2023.11.01 වන දින උදෑසන කාලයේ ඕපාත පොලිස් වසමේ වීරපාන ප්‍රදේශයේදී ඕපාත පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 100 ක් හා හෙරොයින් ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන රුපියල් 602,500/- ක්, ජංගම දුරකථන 06 ක්, සිම්පත් හා විවිධ බැංකු ගිණුම් කාඩ්පත් ඇතුළු දේපල සමඟ** මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු, විහරස්ථානයක වැඩ විසින් හිමිනමක්, තවත් සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ජාවාරම්කරු වයස අවුරුදු 43 ක් වන බොබ් මාලි යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන අයෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 37 ක් වන මොවුන් බලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

අත්අඩංගුවට ගත් සැකකාර හිමිනම වයස අවුරුදු 27 ක් වන කැලණිය ගෝනවල ප්‍රදේශයේ විහාරස්ථානයක වැඩවාසය කරන අතර මත්ද්‍රව්‍ය ජාවාරම්කරු විසින් මෙම හිමිනම මාර්ගයෙන් මත්ද්‍රව්‍ය විවිධ ස්ථානවලට බෙදා හැර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

සිව්වන සැකකරු වයස අවුරුදු 62 ක් වූ වීරපාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මෙම සැකකරු ඉහත මත්ද්‍රව්‍ය ජවාරම්කරු හා සැකකාරිය නවාතැන් ගෙන සිටි නිවසේ හිමිකරු වන අතර සැකකාර හිමිනමගේ පියා බවටද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

2021 අගෝස්තු මස 31 වන දින පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය මඟින් බේරුවල මුහුදු තීරයෙන් අත්අඩංගුවට ගත් හෙරොයින් කිලෝග්‍රෑම් 228 ග්‍රෑම් 644 ක් මෙරටට රැගෙන ඒම, සන්තකයේ තබා ගැනීම හා ජාවාරම් කිරීමට අනුබලදීම හා හෙරොයින් ග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගැනීම සම්බන්ධයෙන්ද අයිස් ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 65 ක් හා හැෂ් ග්‍රෑම් 09 ක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් ද මොවුන්ට විරුද්ධව කොළඹ හා බලපිටිය ගරු අධිකරණවල නඩු විභාග වෙමින් පවතී.

ඕපාත පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**